**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය - 2019**

---

## 1.1 තත්ත්වාගණනය කළ මතය.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ2019දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම.

--------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේඅභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබා ගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.
  මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන**

**1.5.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංචාරක නිකේතනයක් පවත්වාගෙන යාම සඳහා දඹුල්ල ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් දීර්ඝකාලීන බදු පදනම මත පවරාගෙන තිබුණු පැල්වෙහෙර සංචාරක නිකේතනයසඳහා 2011 දෙසැම්බර් 12 දින සිට 2019 දෙසැම්බර් 12 දින දක්වා ගෙවිය යුතු රු. 1,000,000 ක බදු කුලිය සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනයන්සිදුකර නොතිබුණි. | ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශනවල සටහනක් මගින් හෙළිදරව් කිරීමට කටයුතු කරමි. | ගෙවිය යුතු වියදම් සඳහා මූල්‍යප්‍රකාශනවල ප්‍රතිපාදනයන් සිදුකළ යුතුය. |
| (ආ) | ද්‍රව්‍ය අපහරණයකිරීමෙන් ලැබී තිබුණු මුදල රු. 5,900 වුවද ද්‍රව්‍ය අපහරණ විකුණුම් අලාභය වූරු. 308,502 ක මුදල මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා යාමක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා තිබුණි. | මෙය ස්ථාවර වත්කම් අපහරණ විකුණුම් අලාභය නොවන අතර පරිභෝජන භාණ්ඩ විකුණුම් අලාභය වේ. මෙම අලාභය වන රු. 308,502 මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා යාමක් ලෙස දක්වා ඇත්තේ මෙම ගනුදෙනුවද මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ගැලපීම් කර ඇති බැවිනි. ඉදිරියේදි පෙන්වාදී ඇති පරිදි මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනයේ තොරතුරු ඉදිරිපත් කරමි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වත්කම් අපහරණයෙන් ජනිත වූ ශුද්ධ මුදල් ගලා ඒම පමණක් දැක්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පැල්වෙහෙර සංචාරක නිකේතනයේ නඩත්තු වියදම් වෙනුවෙන් ආයතනය දරා තිබුණු රු. 1,962,545 ක මුදලදඹුල්ල ප්‍රාදේශීය ලේකම්ගෙන් අයවිය යුතු ලෙස ගිණුම්ගත කර තිබුණද එම මුදල ආයතනය වෙත ලැබී නොතිබුණි. එසේ වුවත් එම මුදලආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා ඒමක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා තිබුණි. | පැල්වෙහෙර සංචාරක නිකේතනය වෙනුවෙන් මුදල් ලැබී නොතිබුණද එම මුදල අයවියයුතු මුදලක් ලෙස ගිණුම්ගත කර තිබුණි. මෙම මුදල අයවීම පැල්වෙහෙර සංචාරක නිකේතනය යන වත්කමේ ක්ෂය කපාහළ පසු අගය වන බැවින් එම වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ඉදිරිපත් කර ඇත. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ තථ්‍ය මුදල් ලැබීම්පමණක්මුදල් ප්‍රවාහයක් ලෙස දැක්විය යුතුය. |

**1.6** **ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්.**

------------------------------------

**1.6.1** **ලැබිය යුතු මුදල්.**

------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ණයගැති ශේෂය තුළ වර්ෂ 05 කට අධික කාලයක සිට අයවිය යුතුව තිබුණු රු. 484,529 ක පුස්තකාල පොත්, සඟරාවලට අදාළ ලැබීම්, ආයතනයෙන් ලබාගත් භාණ්ඩවලට ලැබිය යුතු මුදල් සහ වැඩිපුර ගෙවන ලද වැටුප් හා දීමනා යනාදී ශේෂ 05ක් පැවති අතර එම ශේෂය ආයතනයේ සේවය කර විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතුව පැවතුණි. | ආයතනයේ සේවයකර විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවියයුතු වර්ෂ 05කට වඩා වැඩි ශේෂය රු. 484,529 වේ. මෙම ශේෂ අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගැනීමට කටයුතු කර ඇත. | අයවිය යුතු ශේෂ කාලීනවඅයකරගැනී මට ක්‍රියාමාර්ග ගත යුතුය. |

**1.7** **නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.**

----------------------------------------------------------------------------

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | මු.රෙ. 756 | 2019 වර්ෂය සඳහා පුස්තකාල පොත් සඳහා භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි | ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ උපදේශන චක්‍රලේඛ අංක 2004/පු.ස/01 අනුව අස්ථානගතවූ පොත් වර්ෂ 2කට වරක් ගණනය කළ යුතුවේ.නමුත් ඉදිරියේදී මු.රෙ 756 ප්‍රකාරව වාර්ෂිකව පුස්තකාල පොත් සමීක්ෂණය සිදු | මුදල් රෙගුලාසි ප්‍රකාරව පුස්තකාල පොත් වාර්ෂිකව සමීක්ෂණය කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | කරමි. නමුත් 2019 වර්ෂයේ මුදල් අංශය හා පුස්තකාල අංශය ඒකාබද්ධවී පුස්තකාලයේ ඇති පොත් අසුරා ඇති රාක්ක වශයෙන් තොරතුරු ගෙන එය වෙන වෙනම පහසුවෙන් හඳුනාගත හැකි පරිදි පරිගණක ගත කරන ලදී. | |
| (ආ) | මු.රෙ. 757(2)(අ) | සමීක්ෂණ වාර්තාව අනුව වෙනස්කම් කිසිවක් තිබේනම් වගකිව යුතු නිලධාරීන්ගෙන් ඒවා සම්බන්ධ කරුණු පැහැදිලි කරගත යුතුය. වෙනස් වේනම් ඒ සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු වුවත් 2011, 2017 සහ 2018 වර්ෂවල අතිරික්තතා සහ ඌනතා සම්බන්ධයෙන් එපරිද්දෙන් කටයුතු කර නොතිබුණි. | ආයතනය විසින් පුස්තකාල පොත් සමීක්ෂණයක් කර තිබුණද පොත් අතිරික්ත හා ඌනතා වෙනුවෙන් කටයුතු කර නොතිබුණි. නමුත් 2019 වර්ෂයේ සිට එම අතිරික්ත හා ඌනතා පැහැදිලිව හඳුනාගෙන අවශ්‍ය කටයුතු සිදුකිරීමට කටයුතු කරමින් පවතී. 2020 වර්ෂයේ පුස්තකාල පොත් සමීක්ෂණය සිදුකිරීමෙන් අනතුරුව මෙම සියලුම ගැටළු නිරාකරණය කිරීමට පියවර ගනිමින් සිටී. | අතිරික්තතා, ඌනතා සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ ආයතනයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 2,065,351 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීවඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 2,301,132 ක් විමෙන් ඉකුත් වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ ඌනතාවයේ අඩුවීම රු. 235,781ක් විය. රජයේ ප්‍රදාන රු. 17,270,000 කින් වැඩිවීම, පර්යේෂණ හා පුහුණු කටයුතු සඳහා ලද ප්‍රාග්ධන ප්‍රදාන රු. 1,439,449 කින් අඩුවීම, වැටුප් හා වේතන වියදමරු. 13,219,583 කින් වැඩිවීම හා වෙනත් වියදම් රු. 5,189,738 කින් වැඩිවීම මෙම මූල්‍ය ප්‍රතිඵලය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශිෂ්‍යත්ව ලබාගෙන විදේශ රටවලට ගිය නිලධාරීන් 07 දෙනෙකුගෙන් නැවත මෙරටට නොපැමිණීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු බැඳුම්කර වටිනාකම වූ රු. 13,486,273 කමුදල අය කර ගැනීමට ඵලදායී පියවරක් ගෙන නොතිබුණි. | 2019 වර්ෂය ආරම්භයේදී විදේශ ශිෂ්‍යත්වලාභී ණයගැති ශේෂය රු.15,387,897 ක්පැවති අතර 2019වර්ෂය තුළ රු. 1,901,629ක් අයකර ගෙන ඇත. ඒ අනුව 2019දෙසැම්බර් 31දිනට අයවිය යුතු විදේශ ශිෂ්‍යත්වලාභී ණයගැති ශේෂය රු.13,486,273 ක් වේ.මෙම ශේෂය අයකර ගැනීමට විධිමත් පියවර ක්‍රියාත්මක වෙමින් පවතී. | මෙකී ණය ශේෂ අදාළ ගිවිසුම් ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ආයතනය සතු නේවාසිකාගාරයේ කාමර 05 ක 2015 මැයි මස සිට 2018 ජූලි දක්වා කෘෂිකර්ම අමාත්‍යවරයාගේ ආරක්ෂක නිලධාරින් නවාතැන් ගෙන තිබුණද ඊට අදාළ කුලිය වන රු. 8,895,470 ක මුදල අය කරගෙන නොතිබුණි. | කෘෂිකර්ම අමාත්‍යවරයාගේ ආරක්ෂක අංශයේ නිලධාරීන් නේවාසිකාගාරයේ කාමර 5ක 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය තෙක් රැඳීසිටීම වෙනුවෙන් අයවිය යුතු ගාස්තු මෙතෙක් ගිණුම්ගත කිරීම සිදුකර නොමැත. ඉදිරියේදී සියලු තොරතුරු පාලක මණ්ඩලය වෙත යොමුකර අදාල උපදෙස් පරිදි ගිණුම්වල මෙම අයවිය යුතු වටිනාකම සටහන් කිරීමට කටයුතු කරමි. | කුලී ගාස්තු අය ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | 2012-2015 කාල පරිච්ඡේදය තුළ රු. 1,031,020 ක පිරිවැයක් දරා ප්‍රධාන කාර්යාලයේ ස්ථාපිත කර තිබූ ජීව වායු ඒකකය 2016 වර්ෂයේ සිට ක්‍රියාවිරහිතව පැවති අතර, එය දීර්ඝ කාලයක් අලුත්වැඩියා නොකර තිබීම හේතුවෙන් එහි උපාංග අක්‍රීය වී නැවත භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත්වී තිබුණි. | 2019 මාර්තු 04 දින ආයතනයේ නිලධාරීන්ගෙන් සැදුමලත් කමිටුවක් විසින් ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය පිළිබඳව සමාලෝචනයක් සිදු කර මෙය පවත්වාගෙන යාම ආර්ථිකමය වශයෙන් ලාභදායී නොවන බව | මෙම ජීවවායු ඒකකය පවත්වාගෙන යාම ආර්ථිකමය වශයෙන් ඵලදායී නොවේ නම් මෙය අපහරණය කිරීමට පියවර ගත යුතුය. |

නිර්දේශ කර ඇත. දැනට පවතින නව තාක්ෂණික ක්‍රමවේද වලට පද්ධතීන් යාවත්කාලීන කිරීමත් ආර්ථිකමය වශයෙන් ලාභදායී නොවන තත්ත්වයක පවතී. මේ වන විට මෙම පද්ධතියට වසර 8ක ආයු කාලයක් ඇත.

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය.**

**4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම.**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කෘෂිකාර්මික සංවර්ධන අවශ්‍යතා හඳුනාගෙන ප්‍රතිපත්ති සම්පාදකයන්ට හා වෙනත් අදාළ පාර්ශවයන්ට පර්යේෂණ ව්‍යාපෘතිවල සොයාගැනීම් හා නිර්දේශ සම්ප්‍රේෂණය කිරීම සඳහා 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම මගින් ප්‍රකාශන (Publications) සඳහා වෙන්කර තිබුණු රු. මිලියන 2.73 ක ප්‍රතිපාදනවලින් 2019 වර්ෂය තුළදී රු. මිලියන 0.775 ක් පමණක් උපයෝජනය කර තිබුණු අතර මාධ්‍ය කාර්යයන් හා ප්‍රදර්ශන සඳහා වෙන්කර තිබුණු ප්‍රතිපාදනය යොදාගෙන කිසිඳු කාර්යයක් කර නොතිබුණි. | 2019 වර්ෂය සඳහා සම්මන්ත්‍රණ, වැඩමුළු, මහජන දේශන යන වැය ශීර්ෂය යටතේරුපියල්මිලියන 0.75 වෙන් කළද 2019දෙසැම්බර් 31දිනට වැය කර ඇති මුදල රු. මිලියන 0.253 ක් විය.මෙයට ප්‍රධාන හේතුව වන්නේ අනපේක්ෂිත ලෙස සිදු වූ පාස්කු ප්‍රහාරය සමඟ සම්මන්ත්‍රණ සහ වැඩමුළු වැනි ජනයා ඒකරාශී කරන වැඩසටහන් මාස කීපයක කාලයක් නොපැවැත්වීම නිසා සැලසුම් කරන ලද කටයුතු ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කාර්යයන් නිසි පරිදි කළ යුතුය |
| (ආ) | ආයතනයේ ප්‍රමුඛතම කාර්යයක් වන පර්යේෂණ වැඩසටහන් සිදු කිරීමෙන් ජනනය වන පර්යේෂණ සොයා ගැනීම් හා නව දැනුම අවශ්‍ය පාර්ශවයන් වෙත (Stake Holders) ලබාදීම සඳහා හඳුනාගත් වැඩසටහන් වාර්ෂිකව හෝ යම් කාලසීමාවකට වරක් විධිමත්ව ක්‍රියාත්මක නොවන බව නිරීක්ෂණය වූ අතර 2017, 2018 හා 2019 වර්ෂවලදී පර්යේෂණ වාර්තා එළි දැක්වීමේ කාර්යය සඳහා ක්‍රියාකාරී සැලසුම් මගින් ප්‍රතිපාදනද වෙන්කර නොතිබුණි. | පර්යේෂණ ග්‍රන්ථ එළි දැක්වීමේ සම්මන්ත්‍රණ 2017 සිට 2019 කාලය තුළ සැලසුම්කර නොමැත. මේ සඳහා අදාළ ඉදිරි කටයුතු සඳහා අවශ්‍ය උපදෙස් ලබාදී වැඩමුළු හා සම්මන්ත්‍රණ පැවත්වීම සඳහා කටයුතු කරනු ඇත.මෙම වාර්තා ඉක්මණින් එළිදැක්වීම සඳහා කටයුතු කිරීමට පියවර ගනු ඇත. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කාර්යයන් නිසි පරිදි කළ යුතුය |

**4.2** **විගණන කමිටුව**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අංක PED 55දරනහා 2010 දෙසැම්බර් 14 දිනැතිරාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව විගණන කමිටු රැස්වීම් අවම වශයෙන් මාස 03 කට වරක් පැවැත්විය යුතු වුවද ආයතනය විසින් 2017, 2018 සහ 2019 වර්ෂවල රැස්වීම් 03 ක් බැගින්පමණක් පවත්වා තිබුණි. | 2019වර්ෂයේදී විගණන කමිටු රැස්වීම් 03ක් පැවැත්වූ අතර අවසාන කමිටු රැස්වීම එම වර්ෂයේ දෙසැම්බර් මස මුල් සතියේ පැවැත්වීමට කටයුතු යොදා තිබුණු අතර 2019නොවැම්බර් මස පැවති ජනාධිපතිවරණයෙන් පසුව ඇති වූ නව රජය බලයට පත්වීමත් සමඟ අධ්‍යක්ෂ මණ්ඩල අහෝසි වූ අතර එකී හේතුවෙන් විගණන කමිටු රැස්වීම සඳහා පාලක මණ්ඩල සාමාජිකයින් පත් කර ගැනීමට නොහැකි විය. 2017 සහ 2018වර්ෂ සඳහා ආයතනයේ ස්ථිරව ලේඛකාධිකාරීවරයෙකු නොසිටි බැවින් එවකට සිටි අධ්‍යක්ෂවරුට විගණන කමිටු රැස්වීම් පැවැත්වීමට අතපසු වී ඇති බව පෙනී ගොස් ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව විගණන කමිටු පැවැත්වීමට කටයුතු කළ යුතුය. |